සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

39078

11 - ශ්‍රේණිය

බුද්ධ ධර්මය - I

නම/විභාග අංකය :- ..........................................................

කාලය: පැය 01යි.

★ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(01) "භවත්නි, මහණ ගොයුම්තුමා වූ කලි මවු පසින් ද පිය පසින් ද යන දෙපසින් මැ අභිජාතයහ. සත්වන මී මුතු යුවළ තෙක් පිරිසිදු මව්කුස ඇත්තෝ ය. ජාතිවාදයෙන් නොහෙළන ලද්දෝ ය" බුදුරජාණන් වහන්සේ පිළිබඳව මෙසේ ගුණ වර්ණනා කරන ලද්දේ,
(1) බිම්බිසාර රජතුමා ය. (2) වංකී බමුණා ය. (3) සෝණදණ්ඩ බමුණා ය. (4) පොට්ඨපාද පිරිවැජියා ය.

(02) සරු දෙය සරු ලෙසත් නිසරු දෙය නිසරු ලෙසත් දැන කටයුතු කිරීමේ අගය පැහැදිලි කරමින් දේශනා කළ ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) අසාරේ සාර මතිනෝ - සාරේච සාර දස්සිනෝ (2) අක්කොච්ඡි මං අවධිමං - අජිනි මං අහාසි මෙ
(3) වරං මේ නාඩිගච්ජෙය්‍ය - සෙය්‍යං සදිස.මත්තනො (4) සාරංච සාරතෝ ඤත්වා - අසාරංච අසාරතෝ

(03) සමාජයේ ඇති නොයෙක් දුසිරිත් දැක දැකත් එම දුසිරිත්වලට ගොදුරු නොවී පිරිසිදු සිතින් වාසය කිරීම,
(1) මධ්‍යම ප්‍රතිපදාවයි. (2) සල්ලේඛ ප්‍රතිපදාවයි. (3) අනගාරික ප්‍රතිපදාවයි. (4) ආරාමික ප්‍රතිපදාවයි.

(04) සමසතළිස් කර්මස්ථාන හෙවත් කමටහන් යොදාගෙන කරනු ලබන භාවනාවකි.
(1) සමථ භාවනාව (2) විදර්ශනා භාවනාව (3) මෛත්‍රී භාවනාව (4) ආනාපානසති භාවනාව

(05) අපි ලෙඩ වෙමු. ජරාජීර්ණ වෙමු. මරණයට පත්වෙමු. මේ සියල්ල සිදුවන්නේ,
(1) දැහැමි දිවිපෙවතින් තොරවීම නිසා ය. (2) අප ගන්නා ආහාරපාන නිසා ය.
(3) ඉපදීම නිසා ය. (4) ආයුෂ අවසන්වීම නිසා ය.

(06) රටේ සිදුවන අපරාධ නවත්වා සාමය පවත්වාගෙන යාම රාජ්‍යපාලනය පිළිබඳ බෞද්ධ ප්‍රතිපත්තිවල දැක්වේ. ඒ පිළිබඳ විස්තර වන්නේ,
(1) දසරාජ ධර්මවල ය. (2) අපරිහානිය ධර්මවල ය.
(3) දස සක්විතිවත්වල ය. (4) සතර සංග්‍රහ වස්තුවල ය.

(07) කථාවත්ථුප්කරණය රචනා වූයේ,
(1) I වන සංගායනාවේ දී ය. (2) II වන සංගායනාවේ දී ය.
(3) IV වන සංගායනාවේ දී ය. (4) III වන සංගායනාවේ දී ය.

(08) පළමු සංගායනාවෙන් පසු භාණක පරපුරක් බිහිවීම වැදගත් සිද්ධියකි. ධර්ම විනය මුඛ පරපුරින් ගෙන යාම භාණකවරුන්ට පැවරුණි. ඒ අනුව බුද්දක නිකාය පවරණ ලද්දේ,
(1) සියලු ම භික්ෂූන්ට ය. (2) ආනන්ද තෙරුන් ප්‍රධාන සිසු පිරිසට ය.
(3) මහාකාශ්‍යප තෙරුන් ප්‍රධාන සිසු පිරිසට ය. (4) සැරියුත් හිමියන්ගේ සිසු පිරිසට ය.

(09) "අභිභූ" රහතන් වහන්සේ සහ ශ්‍රී ලෝකධාතුවට ඇසෙන සේ ගාථා කී බව සඳහන් වන්නේ,
(1) චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය. (2) අරුණවතී සූත්‍රයේ ය.
(3) වේළුද්වාර සූත්‍රයේ ය. (4) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

(10) ලොව ඇත්තේ එක ම මිනිස් ජාතියකි. ජීව විද්‍යාත්මකව බෙදා දක්වන්නේ නම් ඒ ස්ත්‍රී පුරුෂ වශයෙනි. එහෙත් එය ලිංගභේදයක් මිස ජාති භේදයක් හෝ කුලභේදයක් නොවන බව දක්වා ඇති සූත්‍රය වන්නේ,

(1) වසල සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) වාසෙට්ඨ සූත්‍රයයි. (4) කූටදන්ත සූත්‍රයයි.

(11) "හැම කල්හි සිහි ඇති, පමණ දැන ආහාර ගන්නා තැනැත්තාගේ දුක් වේදනා තුනී වේ. වැළඳූ අහර සෙමින් දිරවන අතර ආයුෂය වැඩේ." බුදුන් වහන්සේ මෙසේ දේශනා කරන ලද්දේ,

(1) චූල්ලතිස්ස හිමියන්ට ය. (2) පූතිගත්තතිස්ස හිමියන්ට ය.
(3) අනේපිඬු සිටුතුමාට ය. (4) කොසොල් රජතුමාට ය.

(12) ගිහි - පැවිදි සියලු දෙනාට ම අනුගමනය කළ හැකි ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දී ඇති ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ ය. එම ආචාර ධර්ම පද්ධතිය හඳුන්වනු ලබන්නේ,

(1) සේඛියා නමිනි (2) පන්සිල් නමිනි (3) දසසිල් නමිනි (4) දස කුසල් නමිනි

(13) "යළි යළිත් ඉපදී බුදු දහම ලෝකය පුරා ප්‍රචාරය කරන්නට ලැබේවා" මේ උදාර ප්‍රකාශය කළ ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයා කවරෙක් ද?

(1) අනගාරික ධර්මපාලතුමා (2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (4) වාරියපොළ ශ්‍රී සුමංගල හිමි

(14) අප දකින රූපවල. වස්තුවල හොඳ නොහොඳ හරි හැටි තේරුම් ගැනීමට අපට උපකාර වන්නේ,

(1) පියවි ඇසයි. (2) නුවණැසයි. (3) දිවැසයි. (4) තියුණු ඇසයි.

(15) සුභ මානවයාට පැහැදිලි කළ ආකාරයට කිපෙන සුළු තැනැත්තා,

(1) රෝගී වේ. (2) සෝභාසම්පන්නව නුපදී
(3) දිළින්දෙක් වේ. (4) අනුවණයෙක් වේ.

(16) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" මෙම පාඨයේ තේරුම නිවැරදිව දක්වා ඇත්තේ,

(1) චේතනාව කර්මය නම් වේ. (2) මහණෙනි, චේතනාව කර්මය නම් වේ.
(3) මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. (4) චේතනාව කර්මය යැයි වදාරමි.

(17) "කවරෙකුට නම් දිවා රාත්‍රී පින් වැඩේ ද? කවරෙක් නම් සුගතියට යත් ද? බුදුරදුන්ගෙන් මෙසේ ඇසුවේ කවරෙක් ද?

(1) භික්ෂුවකි. (2) උපාසිකාවකි. (3) සිටුවරයෙකි. (4) දේවතාවෙකි.

(18) අලව් නුවර වැසි භික්ෂු පිරිසක් නව විහාර කර්මාන්ත ආදිය සඳහා බිම් සකසන විට ගස් කොළන් සිඳලූහ. එය සැලවූ විගස බුදුරදුන් විසින් එය වළකාලමින් විනය නීති පණවන ලදි. බුදුරදුන් විසින් එසේ සිදුකරන ලද්දේ,

(1) පරිසර හානි සිදුවීම වළකාලීමට (2) භික්ෂූන්ට නොගැළපෙන නිසා
(3) මිනිසුන්ගෙන් චෝදනා ලැබෙන නිසා (4) විහාර ආරාම ඉදිකිරීමේ දී ගහකොළ නොකැපිය යුතු නිසා

(19) දස රාජ ධර්මවලට අයත් නොවන්නේ,

(1) දානය (2) සීලය (3) භාවනාව (4) මාදුබව

(20) දස සක්විතිවලට අයත් නොවන්නේ,

(1) දිළිඳු ජනයාට ධනය ලබාදීම (2) අධ්‍යාපන ආයතන පිහිටුවා එය දියුණු කිරීම
(3) සිව්පා, පක්ෂි ආදීන්ට අභය දානය දීම (4) සිල්වත් මහණ බමුණන්ගෙන් උපදෙස් ලබාගැනීම

(21) මුදල් ලබාගෙන මිනිසුන් මැරීම, බැංකු මංකොල්ලකෑම, අල්ලස් ලබා ගැනීම, ගණිකා නිවාස පවත්වාගෙන යාම, විවිධ ව්‍යාජ නම්වලින් ආයතන පවත්වාගෙන යාම ආදියෙන් මිනිසා ධනය රැස්කිරීමට පෙළඹී සිටියි. බුදු දහමට අනුව මෙය විග්‍රහ කළ හැක්කේ,

(1) නොදැහැමි ක්‍රියා ලෙස (2) සමාජ අපරාධ ලෙස
(3) සදාචාර විරෝධී ක්‍රියා ලෙස (3) නොදැහැමි, සදාචාර විරෝධී ක්‍රියා ලෙස

(22) "වර්ණභේද හෝ ජාති භේද මිනිසුන් අතර නොපවත්නා බවට සාධක රාශියක් බුදු දහම ඉදිරිපත් කරයි. විශාල ධනයක් රැස්කරගත් විට පුද්ගලයෙකුට කුලයෙන් පහත් වුවත්, උසස් යැයි සම්මත කුල අභිබවා නැගී සිටිය හැකිය" ඉහත කරුණින් සනාථ වන්නේ කිනම් සාධකය ද?

(1) ඓතිහාසික සාධක (2) ජීව විද්‍යාත්මක සාධක
(3) සමාජ විද්‍යාත්මක සාධක (4) ආචාර විද්‍යාත්මක සාධක

(23) බෝසත්වරු වීර්යය උපදවාගෙන වීර්යය පාරමිතාව පුරති. එහි දී ඉදිරිපත් වීමේ දී ඇතිකරගත යුතු වීර්යය හඳුන්වා ඇත්තේ,

(1) පරක්කම ධාතු ලෙසිනි (2) නික්ඛම ධාතු ලෙසිනි
(3) ආරම්භ ධාතු ලෙසිනි (4) වීරිය ධාතු ලෙසිනි

(24) මඝ මානවක ජාතක කතාවෙන් ගම්‍ය වන්නේ බෝසතුන් තුළ පැවති,

(1) උපේක්ෂා පාරමිතාවයි. (2) සත්‍ය පාරමිතාවයි. (3) ප්‍රඥා පාරමිතාවයි. (4) මෛත්‍රී පාරමිතාවයි.

(25) පාරමී ධර්ම පුරන විට අත්පා ආදී ශරීර අංග ද පරිත්‍යාග කරමින් පාරමිතා පිරීම හඳුන්වා ඇත්තේ,

(1) පරමත්ථ පාරමී යනුවෙනි. (2) උප පාරමී යනුවෙනි. (3) පාරමී යනුවෙනි. (4) දස පාරමී යනුවෙනි.

(26) ගංගාරෝහණ පූජෝත්සවය පවත්වා ඇත්තේ කිනම් රජු දවස ද?

(1) කිත්සිරිමෙවන් රජු (2) දෙවනපෑතිස් රජු (3) පළමුවැනි උපතිස්ස රජු (4) පළමුවැනි විජයබාහු

(27) මිහිඳාගමනයෙන් පසු ලක්දිව ස්තූප ඉදිවීම හා වන්දනාමාන කිරීම ප්‍රචලිත විය. ඒ අනුව තෙවරක් ප්‍රදක්ෂිණා කොට අට තැනක දී වැඳිය යුත්තේ කිනම් ස්තූපයකට ද?

(1) මහා ස්තූපයකට (2) මධ්‍යම ප්‍රමාණයේ ස්තූපයකට
(3) කුඩා ප්‍රමාණයේ ස්තූපයකට (4) වටදාගෙයක් සහිත ස්තූපයකට

(28) සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ප්‍රථම වතාවට බෝධි පූජාවක් පවත්වා ඇත්තේ,

(1) දේවතාවෙකි. (2) රහතන් වහන්සේ නමකි (3) රජ කෙනෙකි. (4) සිටුවරයෙකි.

(29) සිඟාලක ගෘහපති පුත්‍රයාට බුදුරඳුන් වදාළ සදිසා නමස්කාරය තුළ උතුරු දිසාවෙන් දක්වා ඇත්තේ,

(1) මිතුරන් ය. (2) ගුරුවරුන් ය. (3) මවුපියන් ය. (4) අඹුදරුවන් ය.

(30) ආමිෂයෙන් සංග්‍රහ කරමින් තමන් රක්ෂණය පෝෂණය කරන ගිහියන්ට ආකාර කීයකින් සංග්‍රහ කළ යුතු යැයි දක්වා තිබේ ද?

(1) 4කින් (2) 5කින් (3) 6කින් (4) 7කින්

(31) බුදුරඳුන් වදාළ සීලය තුළ විරමනය හා සමාදානය දක්නට ලැබේ. මෙහි විරමනය ලෙස දක්වා ඇත්තේ,

(1) දුරුවීමයි. (2) ඇලීමයි. (3) සමාදන් වීමයි. (4) ආරක්ෂා කිරීමයි.

(32) තණ්හාව මුල්කරගෙන කලකෝලාහල ආදිය ඇතිවන අයුරු දක්වා ඇත්තේ,

(1) වසල සූත්‍රයේ ය. (2) මහානිදාන සූත්‍රයේ ය.
(3) අග්ගඤ්ඤ සූත්‍රයේ ය. (4) කරණීයමෙත්ත සූත්‍රයේ ය.

(33) බුදුදහම හදාරණ දරුවෙකු ලෙස ඔබට යම් ගැටළුකාරී තත්ත්වයක් උද්ගත වූ විට, ඒ පිළිබඳව විමසා බැලීමට යොදාගත හැකි බෞද්ධ ඉගැන්වීම වන්නේ,

(1) මධ්‍යම ප්‍රතිපදාවයි. (2) අරි අටඟි මගයි
(3) පටිච්චසමුප්පාදයයි. (4) නියාම ධර්ම විග්‍රහයයි.

(34) "අනුලෝම පටිච්චසමුප්පාදය" තුළ "නාම රූප පච්චයා සළායතනං" ලෙස දක්වා ඇත්තේ,

(1) විඤ්ඤාණය ඇති කල නාම රූප ඇතිවන බවයි. (2) නාම රූප ඇති කල ආයතන සයක් ඇතිවන බවයි.
(3) තණ්හාව ඇති කල උපාදානය ඇතිවන බවයි. (4) සළායතන ඇති කල ස්පර්ශය ඇතිවන බවයි.

(35) චතුරාර්ය සත්‍ය දේශනාවට අයත් දුක්ඛාර්ය සත්‍යයේ විස්තර වන දුක තුන් ආකාර වේ. එනම්,

(1) රූප , අරූප, සංඥා නම් වේ.
(2) දුක්ඛ දුක්ඛ, විපරිනාම දුක්ඛ, සංඛාර දුක්ඛ නම් වේ.
(3) කාම, භව, විභව නම් වේ.
(4) කායික දුක්ඛ, වාචසික දුක්ඛ, මානසික දුක්ඛ නම් වේ.

(36) පුද්ගලයාගේ සිත කිළිටි කරන, වැරදි මගට යොමු කරවන අකුසල් සිතිවිලි තුනකි. එනම්,

(1) අලෝභ, අදෝස, අමෝහ
(2) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම
(3) වේදනා, සංඥා, සංඛාර
(4) ලෝභ, දෝස, මෝහ

(37) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ අයත් වන්නේ,

(1) පංච උපාදානස්ඛන්ධයට
(2) පංච නීවරණවලට
(3) පංච නියාම ධර්මවලට
(4) පංචස්කන්ධයට

(38) සිත කිළිටි කරන, නිවන් මඟ අවුරණ, කෙලෙස් නීවරණ ධර්මයි. එම නීවරණ ධර්ම අතුරෙන් ථීන මිද්ධය උපමා කර ඇත්තේ,

(1) පාට කළ වතුරට ය.
(2) පාසි සහිත වතුරට ය.
(3) උතුරන වතුරට ය.
(4) බොර වතුරට ය.

(39) සතර අගති නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,

(1) ඡන්ද, දෝස, භය, අවිජ්ජා
(2) ඡන්ද, දෝස, උපාදාන, අවිජ්ජා
(3) ඡන්ද, දෝස, භය, මෝහ
(4) ඡන්ද, දෝස, භය, උපාදාන

(40) "ස්වාමීනි, ඔබ වහන්සේ අන්‍යයන් අසන ප්‍රශ්නවලට පිළිතුරු කල්තියා සූදානම් කරගෙන සිටින සේක් ද?" බුදුරදුන්ගෙන් මෙසේ අසන ලද්දේ,

(1) අභයරාජ කුමාරයා ය.
(2) උපාලි ගෘහපතියා ය.
(3) ආනන්ද හිමියන් ය.
(4) කෙසොල් රජතුමා ය.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

11 - ශ්‍රේණිය 39058

බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :- .................................................. කාලය: පැය 02යි.

★ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
★ පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද, හිමි වෙයි

(01) i. සෝණ දණ්ඩ බ්‍රාහ්මණයා බුදුරදුන් හමුවීමට තමාම යාම සුදුසු බව කරුණු ගණනාවකින් බමුණන්ට පැහැදිලි කරයි. ඉන් කරුණු දෙකක් දක්වන්න.

ii. බුදුරදුන් ඇගයීමට ලක් කළ පසුකාලීන උගතුන් දෙදෙනෙකු නම් කරන්න.

iii. "උට්ඨානවතො සතිමතො" යන ධම්මපද ගාථාව තුළ කෙනෙකුගේ දියුණුවට හේතුවන කරුණු හතක් ඇත. ඉහත කරුණු දෙක හැර වෙනත් කරුණු දෙකක් ලියන්න.

iv. දහමේ ඉගැන්වෙන භාවනා ක්‍රම දෙක ලියන්න.

v. "භව නිරෝධා ජාති නිරෝධෝ" මෙම පාඨයේ තේරුම ලියන්න.

vi. පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද සංවර්ධනය පිළිබඳ අඩිතාලම පංචසීලයයි. දහම තුළ පංච සීලය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

vii. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අයත් වේ. ඉන් ප්‍රඥාවට අයත් කොටස් දෙක නම් කරන්න.

viii. ශාරීරික ධාතු තැන්පත් කොට චෛත්‍ය සාදා උපහාර දැක්වීමට සුදුසු බවට බුදුරදුන් අනුමත කළ දෙදෙනෙකු නම් කරන්න.

ix. නොකළ යුතු වෙළඳාම් දෙකක් ලියන්න.

x. "චුතුපපාත ඥානය" යනු කුමක්දැයි පහදන්න. (02 x 10 = 20)

(02) "කිසිදු විටෙක තමන් නිසා හෝ අනුන් නිසා හෝ තම අඹු දරුවන් නිසා හෝ රටවැසියන් නිසා හෝ අධාර්මිකව ධනය නොඉපදවිය යුතුය" මෙය බුදුරදුන් දේශනා කළ ගාථාවක අදහසයි.

i. මෙයින් විස්තර වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කිනම් මාර්ගාංගය ද? (ලකුණු 02)

ii. බුදුරදුන් අනුදත් ධාර්මිකව ධනය උපයා ගත හැකි රැකියා තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. අධාර්මිකව ධනය උපයනවාට වඩා දැහැමි වීර්යයෙන්, දැහැමින් ධනය උපයාගෙන සාර්ථක ජීවිතයක් ගත කළ හැකි අයුරු පහදන්න. (ලකුණු 05)

(03) i. දස රාජ ධර්මවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. සතර සංග්‍රහ වස්තුවලින් තුනක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

iii. දැහැමි රාජ්‍ය පාලනයක් ගෙන යාමේ දී දසරාජ ධර්මවල අදාළත්වය ඉන් කරුණු පහක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) මිනිස් සමාජය තුළ විවිධ දුරාචාරයන්ගෙන් යුත් පිරිස් දක්නට ලැබේ. මෙබඳු සමාජයක් තුළ වරදෙහි හා දුසිරිත්වල නොයෙදී ජීවත්වීම බුදු දහම අගයයි.

i. එසේ ජීවත්වීම දහමෙහි හඳුන්වා ඇත්තේ කිනම් නමකින් ද? (ලකුණු 02)

ii. "ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි, චිත්තං යස්ස න කම්පති" මෙයින් කියවෙන දහම් කරුණ කුමක් ද? (ලකුණු 03)

iii. සමාජය තුළ කුමන අන්දමේ බාධා දුෂ්කරතා, පෙළඹවීම් තිබුණත් ශිෂ්‍ය ජීවිතය ආදර්ශමත්ව හා සාර්ථකව ගත කළ හැකි ආකාරය දහමට අනුව දක්වන්න. (ලකුණු 05)

(05) i. පළමු සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 02)

ii. දෙවන සංගායනාව පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර කීයකට පසුව ද? පැවැත්වූ ස්ථානය කුමක් ද? පැවැත්වීමට බලපෑ හේතුව කුමක් ද? (ලකුණු 03)

iii. තෙවන සංගායනාවේ ප්‍රතිඵල පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

(06) "දරුවනේ, අපි කරන කියන හැමදේම කර්මය වෙන්නෙත් නෑ. අපට සිදුවන හැම දෙයක් ම කර්මය නිසා සිදුවෙන්නෙත් නෑ. අපි කරන කර්ම ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදෙනවා." මෙසේ පැහැදිලි කරන ලද්දේ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේ විසිනි.

i. එසේ බෙදෙන කොටස් දෙක දක්වන්න. (ලකුණු 02)

ii. කර්ම විපාක පිළිබඳව සඳහන් වන සූත්‍රය කුමක් ද? එය දේශනා කරන ලද්දේ කාහට ද? කොහේදී ද? (ලකුණු 03)

iii. තමා කළ කර්මයට අනුව විපාක විඳීමට සිදුවන බව බුදු දහමෙහි පෙන්වා දී ඇත. මිනිසුන්ගේ විවිධත්වයට බලපාන හේතු පහක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) i. වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව සඳහන්වන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 02)

ii. වෛරය සන්සිඳෙන ආකාරය පිළිබඳව ගාථාවට අනුව කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

iii. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ඉහත ගාථාවෙන් ලද හැකි ආදර්ශය පහදන්න. (ලකුණු 05)